# දිනැස

1 කලාපය


උපදේශක මණ්ඩලය :

මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ

මහාචාර්ය ති. ර. ගාමිණි දැල බණ්ඩාර

ආචාර්ය එච්. ඩබ්ලිව්. කරුණාරත්න

සංස්කරණය:

පූජ්‍ය ගල්කිරියාගම විමලානන්ද හිමි

අනුරින් ඉන්දිකා දිවාකර

නදීරා සරෝජනී ජයතුංග



2002

අවශ්‍යතාවන්ට අලුත් වචන අවශ්‍ය වේ. එයත් භාෂා පරිණාමයට රුකුලක් වේ.

යම්කිසි ජීවභාෂාවක සිදුවන භාෂා පරිණාමය ඒ මොහොතේ ම අපට දෘශ්‍යමාන නොවේ. කාලයත් සමඟ පරිණාමයේ ප්‍රතිඵල අපට දැකගත හැකි වේ. භාෂා පරිණාමය අපට වැදගත් වනුයේ භාෂා දෙකක ඇති වෙනස්වීම අවබෝධ කර ගැනීමට එය ඉවහල් වන නිසා යි. එයින් භාෂා අතර සන්නිවේදනය නොව ඒවා අතර වෙනස්වීම සලකා බැලිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


01. අමරවංශ හිමි, කොත්මලේ - ලක්දිව සෙල්ලිපි, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1969.

02. කරුණාතිලක, ඩබ්ලිව්.එස්. - ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය, ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1989.

03. කහඳගමගේ, පියසේන - ප්‍රාදේශීය ව්‍යවහාර, ගොඩගේ පොත් මැදුර, කොළඹ, 1998.

04. ගයිගර්, විල්හැම් - සිංහල භාෂාවේ ව්‍යාකරණය, රාජකීය ආසියාතික සංගමය, ලංකා ශාඛාව, කොළඹ, 1993.

05. ජයසේකර, ආනන්ද; ජයසේකර චිත්‍රා; රාජපක්ෂ, ආර්.එම්.ඩබ්; දැලබණ්ඩාර, ගාමිණී. (සංස්) - වාග්විද්‍යාත්මක ලිපි, සම්භාව්‍ය ප්‍රකාශන, කොළඹ, 1996.

06. දිසානායක, ජේ.බී. - භාෂාවක භාවිතය හා විග්‍රහය, ලේක්හවුස් කොළඹ, 1970.

07. ධර්මදාස, කේ.එන්.ඕ. - භාෂාව හා සමාජය, ලේක්හවුස්, කොළඹ, 1972.

08. බලගල්ලේ, විමල් ජී. - භාෂා අධ්‍යයනය සහ සිංහල ව්‍යවහාරය, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1995.

09. රාජපක්ෂ, ආර්.එම්.ඩබ්; දැල බණ්ඩාර, ගාමිණී. (සංස්) - සම්භාව්‍ය ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය, සම්භාව්‍ය ප්‍රකාශන, කැලණිය, 1995.

10. සිල්වා, සුගතපාල ද. - විග්‍රහාත්මක වාග්විද්‍යාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1963.

11. සිල්වා, සුගතපාල ද. - භාෂා විෂයක ලිපි, ලේක්හවුස්, කොළඹ, 1972.

12. Hockett, C.F. - **A Course in Modern Linguistics**, The Macmillan Company, New York, 1967.

# 4. ලේඛන සිංහල විධික්‍රියාව

කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි

විධානයක්, නියෝගයක්, ඉල්ලීමක් සඳහා යොදනු ලබන්නේ විධික්‍රියාවයි.[1] සාමාන්‍යයෙන් මෙය ලේඛන සිංහලයෙහි මධ්‍යම පුරුෂයෙහි වරනැගේ.[2] එහෙත් ප්‍රථම පුරුෂයෙහිත් වරනැගුන අවස්ථා දක්නට ලැබේ. උදහරණ -

"මේකරු මේ පිසන්නේ"[3]

විධානයක් අතීතයට බලපාන්නේ නැත. එනිසා අතීත කාල විධික්‍රියා නැත. විධානය වර්තමානයට හා අනාගතයට පමණක් බලපානු ලැබේ. එබැවින් ලේඛන සිංහල විධික්‍රියාව සඳහා ඇත්තේ කාල දෙකකි. ඒ වර්තමාන හා අනාගත යන කාල දෙකයි. ලේඛන සිංහලයෙහි විධික්‍රියාව සඳහා අනාගත කාලය ඇඟවීමට විශේෂ වූ ක්‍රියා ප්‍රත්‍ය දක්නට නොලැබේ. එය හැඟවෙන්නේ යොදනු ලබන පරිසරය හා කාලවාචී පදවලිනි. ඒ අනුව ලේඛන සිංහලයෙහි අනාගත කාල විධික්‍රියාව සඳහා වර්තමාන විධික්‍රියාව යොදනු ලැබේ. උදහරණ -

"අම්මණ්ඩින්ට අප වැඳ සමුගත් බව කියන්න"[4]

"ඔහු බිලි දිත් මා රැක ගන්ව"[5]

විධානයක් ආදරයෙන් හෝ අනාදරයෙන් කළ හැක.

**විධික්‍රියා වරනැගීම් :-**

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| මධ්‍ය පුරුෂය | බල/බලව | බලවු |
| | කර/කරව | කරවු |
| | කිය/කියව | කියවු |

© කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමි

ගල්කිරියාගම විමලානන්ද හිමි, අනුරින් ඉන්දිකා දිවාකර, නදිරා සරෝජනී ජයතුංග, (සංස්) 2002, දිනැස. සංස්කාරක ප්‍රකාශනයකි. පිටු 31 - 37

විධික්‍රියා ප්‍රත්‍ය :-

| | ඒකවචන | බහුවචන |
|---|---|---|
| | ɸ / ව | වූ |

/ɸ/ ප්‍රත්‍යයෙන් ගැනෙන විධික්‍රියා, ක්‍රියා ධාතුන් ය. ඒවා බොහෝමයක් ස්වරාන්ත ද වේ. √බො බීමෙහි, √දෙ දීමෙහි යන ධාතු මූල ɸ ප්‍රත්‍යයෙන් නැගෙන විධික්‍රියාවේ යෙදෙන්නේ නැත. √ගන් වැනි ක්‍රියා ධාතු හැර අනෙක් හලන්ත ධාතු ɸ ප්‍රත්‍යයෙන් අර්ථවත් වන විධික්‍රියාවේ නොයෙදේ. උදහරණ -

√ උගන් - ඉගැන්වීමෙහි
√ ඉස් - ඉසීමෙහි

ඉකාරාන්ත ධාතු විධික්‍රියාවෙහි යෙදීමේ දී ඒකවචනය සඳහා පමණක් "උ" කාරය ආදේශ වේ. උදහරණ -

√ බිඳි - බිඳීමෙහි
√ වඳි - වැඳීමෙහි

| ඒකවචන | බහුවචන |
|---|---|
| බිඳු/බිඳුව | බිඳිවූ |
| වඳු/වඳුව | වඳිවූ |

එකාරාන්ත ක්‍රියා ධාතු විධික්‍රියාවෙහි යෙදීමේ දී එම එකාරය වෙනුවට වෛකල්පික*[1] වශයෙන් "ඉය" යන්න ආදේශ වේ. මෙම ආදේශය වචන ද්වයෙහි ම යෙදේ.

√ ගිලිහෙ - ගිලිහීමෙහි
√ පිරිහෙ - පිරිහීමෙහි

| ඒකවචන | බහුවචන |
|---|---|
| ගිලිහිය | ගිලිහියවූ |
| පිරිහිය | පිරිහියවූ |

---

*[1]

| ඒකවචන | බහුවචන |
|---|---|
| ගිලිහේ | ගිලිහෙවු |
| පිරිහේ | පිරිහෙවු |

සිදත් සඟරාව නම් පැරණි සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයෙහි විධික්‍රියාව පිළිබඳ ව සඳහන් වන්නේ පහත සඳහන් අයුරිනි.

"වන්මන් අනාරු
නොවෙන්ව හොත අනදරින්
අදරින් හොතක අන් සඳ
සබඳ විදහන් විදි නම්"[6]

අර්ථය :-

වර්තමාන, අනාගත කාල දෙකට සමාන වූ ක්‍රියා පදයකින් ආදරයෙන් හෝ අනාදරයෙන් හෝ මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ දෙකට ඇතුළත් කෙනෙකුන් යෙදීම විධි නම්. ඒ විධ්‍යර්ථයෙහි*2 වූ ක්‍රියාව විධික්‍රියා නම් වේ.

විධික්‍රියාව සඳහා සිදත් සඟරාවෙහි ප්‍රත්‍යයන් 06 ක් දැක්වේ. "අ", "ඒ", "අන්නේ", "අන්නැ", "අවු", "උ" යන මේවා එම ප්‍රත්‍යයෝ යි.[7]

"අ" - බමුණු පහද බොජ[8]
(බ්‍රාහ්මණය පසුදින බෝජනය කරන්න)
බල සේනානායක සපුකුමරු එන[9]
"සිතු නතුකර අස යහළුව වඩන රුති"[10]

"ඒ" - සැරදේ මහබා[11]
(මහත් භාග්‍යවන්තය චිරාත් කාලයක් ජිවත්වෙහි)

"අන්නේ" - මේ කරු මේ පිසන්නේ[12]
(භක්කාරක කෙම භක්තය පචනය කරන්නේය)
නුඹ වහන්සේ වනාන්තරයට ම
වඩින්නේ මැනව[13]

"අන්නැ" - "හිමි නුඹ දහම දෙසන්නැ"[14]
(ස්වාමිනි ඔබ දහම් දෙසන්න)

---

*2 මහාර්ෂි පාණිනි, පතඤ්ජලි ආදි වියතුන් විධානය සිව් වැදැරුම් බව දක්වා තිබේ.
1. විධි :- මෙහෙකරු ආදීන් කිසියම් ක්‍රියාවන්හි යෙදවීම.
2. නිමන්ත්‍රණ :- දූ දරු ආදීන් යම් යම් ක්‍රියාවන්හි නියෝග කිරීම.
3. ආමන්ත්‍රණ :- කැමති නම් කරන ලෙස අනුදැනීම.
4. අධිෂ්ට :- වක්තරා පුර්වක වූ ව්‍යාපරය.

"අව්" - "ගුණෙ කැත්නම් මෙහි බජව්"[15]
(මේ ක්‍රියාවෙහි ගුණයක් ඇත්නම් එය භජනය කරන්න)
තොපි හැමදෙනම දනාදී පින්කම් කරව්"[16]

"උ" - "සජනෙනි යහපත් දක්කු"[17]
(සත්පුරුෂයෙනි යහපතක් දකින්න)
"ගනු අවසර එනිරිඳු සිරිපතුල් වැඳ"[18]

ඉහත දක්වා ඇති උදහරණයන්හි "මේකරු මේ පිසන්නේ" යනු "අන්නේ" ප්‍රත්‍ය සඳහා දි ඇති උදහරණය යි. මෙය ප්‍රථම පුරුෂ විධික්‍රියාවෙන් යෙදී ඇත. මුණිදස කුමාරතුංග මැතිඳුන් දක්වන අන්දමට "අන්නේ" ප්‍රත්‍ය විධික්‍රියාවක් වීමට නම් "මැනවි" යන්න එක් කළ යුතු බව යි.[19]

උදහරණ -

යහළුව යන්නේ .................
යහළුව යන්නේ මැනවි

සිදත් සඟරාවෙහි සඳහන් ප්‍රත්‍යවලට අමතර ව විධික්‍රියාව සඳහා තවත් ප්‍රත්‍යයන් කීපයක් අපහරණය කොට දැක්විය හැක. ඒවා නම් "ඕ", "ආ", "ග", "න්", "න", "නු", "ව", "නේ", "හි"

"ඕ" - වරෝ හිමි මේ දුප්පත් තොප විසින් තොප තෙල
උරමඩලෙහිලා සනහවා[20]

"ආ" - "මහණ නික්ම යා[21]

"ග" - බලග මිතුර විසිතුරු මිහිරි පැන්නේ[22]

"න" - තොසා වඩන මග සැබෑ මොරටුවඑල්ලියේ[23]

"න්" - ඉඳුරා බලන් සඳෙහි සිට පොතුපිටිය[24]

"නු" - අනියම් විඳිද සලකනු[25]

"නේ" - නුඹ වඳනේ පළමුවෙන් වෙහෙරතට[26]

"හි" - ඉසිඹු ලමින් යෙහි සැල දඹ පඳුරුවල[27]

විධික්‍රියාර්ථය සඳහා අපහරණය කළ හැකි තවත් ප්‍රත්‍ය කිහිපයක් වේ.

1. පූර්ව ක්‍රියාවෙන් පරව "පිය" යන ප්‍රත්‍යයට "ව" යන ප්‍රත්‍ය එක්ව විධික්‍රියාව සෑදේ. උදහරණ -

උදුරා පියව
ලාපියව
හැරපියව

2. "මැනව" යන ප්‍රත්‍ය අතීත කෘදන්තයෙන් පරව යෙදීමෙන් විධික්‍රියාව සෑදේ. උදහරණ -

ඇස්සුව මැනව
කෑව මැනව
දුන මැනව

3. "මැනව" යන ප්‍රත්‍ය භාව කෘදන්තයෙන් පරව යෙදීමෙන් ද විධික්‍රියාව සෑදේ. උදහරණ -

යවනු මැනව
පනිනු මැනව
නික්මුණු මැනව

4. "මැනවි", "යහපති" යන පද අසම්භව්‍ය ක්‍රියාවට පරව යෙදීමෙන් ද විධික්‍රියා නිපදවනු ලැබේ. උදහරණ -

දුනහොත් මැනවි
වැඩියහොත් යහපති

5. වර්තමාන කෘදන්තයෙන් පරව "බව සුදුසුය" යන යෙදුම යෙදීමෙන් ද විධික්‍රියා අර්ථය ප්‍රකාශ වේ. උදහරණ -

ස්වාමීනි අන් තැනකට වඩනා බව සුදුසුය[28]

6. බලම්හ
කම්හ
බඳිම්හ යන මේවා ද විධික්‍රියා ලෙස සැලකෙන අතර ඒවා උත්තම පුරුෂයෙහි බහුවචන විධික්‍රියා සේ සැලකෙයි.

පැරණි සාහිත්‍යය තුළ ''බලව'', ''යව'' වැනි විධික්‍රියාවල ඇති වකාරය වෙනුවට ''ග'' කාරය යෙදී ඇත.

බලව - බලග
කියව - කියග

විධික්‍රියාව නැතැයි අර්ථයට හැරවීමේ දී ''නො'' යන නිපාතය යොදනු ලැබේ.

නොකර නොකරව නොකරවී
නොබල නොබලව නොබලවී

ලිවීම, බැලීම වැනි ක්‍රියා නාමයන්ගෙන් පසු ''තහනම්'' යන්න යෙදීමෙන් ද විධික්‍රියාවක් නාස්ත්‍යාර්ථයට හැරවිය හැක.
උදහරණ-

ලිවීම තහනම්
බැලීම තහනම්

භාව කෘදන්තයට පෙර ''නො'' නිපාතය යෙදීමෙන් ද, භාව කෘදන්තයට පසු ''එපා'' යන්න යෙදීමෙන් ද නාස්ත්‍යාර්ථ විධික්‍රියාව නිපදවේ.

## පාදක සටහන්

1. ඩබ්ලිව්. ඇස්. කරුණාතිලක. **සිංහල භාෂා ව්‍යාකරණය**. 1997. සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ. (190 පි.)
2. --- **එම** --- (191 පි.)
3. මුනිදස කුමාරතුංග. **සිදත් සඟරා විවරණය**. 1964. කේ. ඒ. ආරියදස සහ සමාගම. කොළඹ 10. (28 පි.)
4. ඒ. ඒ. අභයසිංහ. (සංස්කාරක) **බුත්සරණ (තෝරාගත් කථා කිහිපයක්)**. 1998. අභය මුද්‍රණ ශිල්පියෝ හා ප්‍රකාශකයෝ. මහර. කඩවත. (109 පි.)
5. --- **එම** ---(61 පි.)
6. රත්මලානේ ශ්‍රී ධර්මාරාම මාහිමි. **සිදත් සඟරා සන්නය**. 1902. විද්‍යාලංකාර පිරිවෙන මඟින් ප්‍රකාශිතයි. 7 වන මුද්‍රණය. පෑලියගොඩ. (151 පි.)
7. --- **එම** --- (151 පි.)
8. මුනිදස කුමාරතුංග. **සිදත් සඟරා විවරණය**. 1964. කේ. ඒ. ආරියදස සහ සමාගම. කොළඹ 10. (28 පි.)
9. පි. එස්. බී. සේනානායක. **සැළලිහිණි සංදේශය**. 1990. තෘතිය මුද්‍රණය. ප්‍රදීප ප්‍රකාශකයෝ. කොළඹ 12. (151 පි.)

10. --- **එම** --- (63 පි.)

11. මුනිදස කුමාරතුංග. **සිදත් සඟරා විවරණය**. 1964.
කේ. ඒ.ආරියදස සහ සමාගම. කොළඹ 10. (28 පි.)

12. --- **එම** --- (403 පි.)

13. ඒ. ඒ. අභයසිංහ. (සංස්කාරක) **බුත්සරණ (තෝරාගත් කථා කිහිපයක්)**. 1998.
අභය මුද්‍රණ ශිල්පියෝ හා ප්‍රකාශකයෝ. මහර. කඩවත. (91 පි.)

14. මුනිදස කුමාරතුංග. **සිදත් සඟරා විවරණය**. 1964.
කේ. ඒ. ආරියදස සහ සමාගම. කොළඹ 10. (28 පි.)

15. --- **එම** --- (403 පි.)

16. ඒ. ඒ. අභයසිංහ. (සංස්කාරක) **බුත්සරණ (තෝරාගත් කථා කිහිපයක්)**. 1998.
අභය මුද්‍රණ ශිල්පියෝ හා ප්‍රකාශකයෝ. මහර. කඩවත. (91 පි.)

17. මුනිදස කුමාරතුංග. **සිදත් සඟරා විවරණය**. 1964.
කේ. ඒ.ආරියදස සහ සමාගම. කොළඹ 10. (28 පි.)

18. පී. එස්. බී. සේනානායක. **සැළලිහිණි සංදේශය**. 1990. තෘතිය මුද්‍රණය.
ප්‍රදීප ප්‍රකාශකයෝ. කොළඹ 12. (91 පි.)

19. මුනිදස කුමාරතුංග. **සිදත් සඟරා විවරණය**. 1964.
කේ. ඒ.ආරියදස සහ සමාගම. කොළඹ 10. (405 පි.)

20. ඒ. ඒ. අභයසිංහ. (සංස්කාරක) **බුත්සරණ (තෝරාගත් කථා කිහිපයක්)**, 1998.
අභය මුද්‍රණ ශිල්පියෝ හා ප්‍රකාශකයෝ. මහර. කඩවත. (73 පි.)

21. ඩබ්ලිව්. ඒ. එෆ්. ධම්මවර්ධන. **පරවි සංදේශ කාව්‍ය වර්ණනාව**, 1947.
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ. (43 පි.)

22. --- **එම** --- (26 පි.)

23. ඩබ්ලිව්. එෆ්. ගුණ වර්ධන. **කෝකිල සංදේශය වර්ණනාව**. 1962.
තෙවන මුද්‍රණය. මහා බෝධි යන්ත්‍රාලය. කොළඹ. (97 පි..)

24. රත්මලානේ ශ්‍රී ධර්මාරාම මාහිමි. **සිදත් සඟරා සන්නය**. 1902.
විද්‍යාලංකාර පිරිවෙන මගින් ප්‍රකාශිතයි. 7 වන මුද්‍රණය. පැලියගොඩ.
(151 පි.)

25. ඩබ්ලිව්. ඒ. එෆ්. ධම්මවර්ධන. **පරවි සංදේශ කාව්‍ය වර්ණනාව**, 1949.
ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ. (69 පි.)

26. පී. එස්. බී. සේනානායක. **සැළලිහිණි සංදේශය**. 1990. තෘතිය මුද්‍රණය.
ප්‍රදීප ප්‍රකාශකයෝ. කොළඹ 12. (115 පි.)

27. පී. එස්. බී. සේනානායක. **සැළලිහිණි සංදේශය**. 1990. තෘතිය මුද්‍රණය.
ප්‍රදීප ප්‍රකාශකයෝ. කොළඹ 12. (91 පි.)